# අපරාධයකට ලක් වූ විදේශිකයන්ගේ හිමිකම් සහ සහායක යෝජනා ක්‍රමය

අපරාධයකට ලක් වූ විට විමර්ශන කිරීම හෝ නඩු විභාගයකදී
ඔබට පහත දැක්වෙන හිමිකම් සහ සහයෝග ලබාගත හැක.

- පරීක්ෂණයක් හෝ නඩු විභාගයකදී ඔබ ආතතියට හෝ කනස්සල්ලට පත්වුවහොත් ඔබට විශ්වාස කළ හැකි අයෙකු තබා ගැනීමට හැකි අතර, සන්නිවේදනය සඳහා භාෂා පරිවර්තකයෙක් ඉල්ලා සිටිය හැකිය, නඩු විභාගයකදී ඔබට මතයක් ප්‍රකාශ කිරීමට අධිකරණයට සෘජුවම සහභාගි විය හැකිය.

- ඔබ ලිංගික අතවර හෝ ළමා අපචාර වලට ගොදුරු වූ අවස්ථාවක අපරාධ නඩු කටයුත්තකදී නීති සහය ලබා ගැනීමට නීතිඥයෙකු පත් කර ගත හැකි අතර, ඔබට නීතිඥයෙකු නොමැති අවස්ථාවකදී පරීක්ෂකවරයා විසින් තෝරා ගන්නා ලද නීතිඥයෙකුගෙන් උදව් ලබාගත හැකිය.

- ගෘහස්ථ හිංසනය හෝ ළමා අපචාර වලට ගොදුරු වූ අවස්ථාවක අපරාධකරුට එරෙහිව අපචාර තහනම් නියෝගයක් ලබා ගැනීම සඳහා නීතිමය පියවර ගන්නා මෙන් පරීක්ෂකවරයාගෙන් හෝ පොලීසියෙන් ඉල්ලා සිටිය හැකිය, තවද සෘජුවම ඔබගේ ආරක්ෂාවට ක්‍රියා මාර්ග ගන්නා ලෙස උසාවියෙන් ඉල්ලා සිටිය හැකිය.

- වැරදිකරුගෙන් වන්දි මුදල ලබා ගැනීමට නොහැකි අවස්ථා වල පරීක්ෂණයෙන් පසු නඩු පවරන කාර්යාලයෙන් වෛද්‍ය ප්‍රතිකාර වියදම් වැනි මූල්‍යාධාර ලබාගත හැකිය. (කෙසේ වෙතත්, මෙවැනි අවස්ථාවකදී විත්තිකරු කොරියාවේ නිත්‍යානුකූලව ලියාපදිංචි වී සිටිය යුතුය අතර, වැරදිකරු විදේශිකයෙක් නම් විත්තිකරු විදේශිකයන් ලියාපදිංචි කිරීම අවසන් කර තිබිය යුතුය.)

- ගෘහස්ථ හිංසනය හෝ ලිංගික අතවර වලට ගොදුරු වූ අවස්ථාවක පරීක්ෂණ·නඩු විභාග ක්‍රියාවලිය අවසන් වන තුරු ඔබගේ වීසා කාලය දීර්ඝ කිරීම සඳහා අයදුම් කළ හැකිය. (නමුත්, ගෘහස්ථ හිංසනය වැනි අවස්ථාවක සහකරු හෝ සහකාරිය කොරියාවේ පුරවැසියෙකු විය යුතුය)

- මිනීමැරුම්, තුවාල.ජීවිත, ශරීර හානි වැනි අපරාධ සහ සොරකම්, දේපල වංචා ආදී අපරාධ සහ ලිංගික අපරාධ ආදිය අපරාධ පිළිබඳ විමර්ශනයේදී, විත්තිකරු නීතිවිරෝධී විදේශිකයෙකු වුවද ඔබව භාර නිලධාරියට ඔබගේ පෞද්ගලික තොරතුරු ආගමන විගමන කාර්යාලය වෙත දැනුම් දිය නොහැකි ය.

※ වැඩි විස්තර සඳහා නඩු පවරන කාර්යාලයේ විත්තිකර සහයක අංශය දුරකථන(☎1577-2584) අමතන්න. අපරාධ විමර්ශන අංශය (www.kics.go.kr)ට සම්බන්ධ වී පරීක්ෂා කරන්න.

※ නඩු පවරන කාර්යාලයට දුරකත ඇමතුමක් ලබා දී හෝ පැමිණ උපදෙස් ලබා ගන්නා අවස්ථාවකදී භාෂා පරිවර්තකයෙක් අවශ්‍ය නම්, අදාල නඩු පවරන කාර්යාලයට භාෂා පරිවර්තන සේවයක් ලබා දීමට හැකිද යන්න විමසීම හෝ තානාපති කාර්යාල සහ බහු සංස්කෘතික පවුල් සහාය මධ්‍යස්ථානය(☎1577-1366)ට දුරකථන ඇමතුමක් ලබා දී භාෂා පරිවර්තන සේවය පිළිබඳව විමසන්න.

**<ඉහත සඳහන් තොරතුරු ලබා ගත් බවට සහතික කරමි>** 20 . . . **සහතික කරන්නා** **අත්සන**

**<වෙනත් ආකාරයකින් ලබා ගැනීමේදී>**

**වාචික ☐ දුරකථන☐ ෆැක්ස්☐ තැපැල් ☐ වෙනත් ☐** **භාර නිලධාරියා** **අත්සන**